# දිවි මගට එළිය දෙන දහම් පද



# දිවි මගට එළිය දෙන දහම් පද

## ත්‍රිපිටකය

විනය පිටකය

සූත්‍ර පිටකය

අභිධර්ම පිටකය

- දීඝනිකාය
- මජ්ඣිමනිකාය
- සංයුත්තනිකාය
- අංගුත්තරනිකාය
- ඛුද්දකනිකාය

# දිවි මගට එළිය දෙන දහම් පද

## සූත්‍ර පිටකයේ ඛුද්දකනිකායට අයත් ග්‍රන්ථ පහළොවෙන් එකකි ධම්මපදය

1. ඛුද්දක පාඨ
2. ධම්ම පදය
3. උදාන
4. ඉතිවුත්තක
5. සුත්ත නිපාත
6. විමාන වත්ථු
7. පේත වත්ථු
8. ථේර ගාථා පාලි
9. ථේරී ගාථා පාලි
10. ජාතක පාලි
11. නිද්දේස පාලි
12. පටිසම්භිධාමග්ග
13. අපදාන
14. බුද්ධ වංස
15. චරියා පිටක

# දිවි මගට එළිය දෙන දහම් පද

✓ ධම්ම පදය බෞද්ධයාගේ මුදුන් මල්කඩ ලෙස සැලකෙන හස්තසාර ග්‍රන්ථයකි. එය බෞද්ධයාගේ අත් පොත ය. සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් පොත් 15න් එකකි. විශ්ව භාෂා ගණනාවකට පරිවර්තනය කර ඇත.

✓ ධම්ම පදයෙහි ගාථා 423 කි.

✓ මෙහි වග්ග 26 කි

✓ නිදාන කතා 299 කි,

# දිවි මගට එළිය දෙන දහම් පද



අක්කොච්ඡි මං අවධි මං
අජිනි මං අහාසි මේ
යේ තං උපනයිහන්ති
වේරං තේසං න සම්මති

අසවලා මට බැන්නේය, මට පහර දුන්නේ ය, මා පරාජය කළේය, මගේ දේ පැහැර ගත්තේ ය. යනුවෙන් යළි යළිත් සිතයි නම් ඔහුගේ වෛරය සන්සිඳෙන්නේ නැත.

??????????? 2.m4a

# දිවි මගට එළිය දෙන දහම් පද

අක්කොච්ඡි මං අවධි මං
අජිනි මං අහාසි මේ
යේ තං න උපනයිහන්ති
වේරං තේසූපසම්මති



අසවලා මට බැන්නේ ය, මට පහර දුන්නේ ය, මා පරාජය කළේ ය, මගේ දේ පැහැර ගත්තේ ය, යනුවෙන් යළි යළිත් නොසිතයි නම් ඔහුගේ වෛරය සන්සිඳේ.

???????????.m4a

# දිවි මගට එළිය දෙන දහම් පද

නතං කම්මං කතං සාධු
යං කත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛෝ රෝදං
විපාකං පටිසේවති

යම් ක්‍රියාවක් සිදු කොට පසු තැවීමට සිදුවේ ද යමක විපාකය කඳුළු පිරි මුහුණින් යුතු ව අඬමින් විඳින්නට සිදු වේ ද එබඳු ක්‍රියා නොකිරීම යහපත් ය.



??? ?????.m4a

# දිවි මගට එළිය දෙන දහම් පද



තඤ්ච කම්මං කතං සාධු
යං කත්වා නානුතප්පති
යස්ස පතීතෝ සුමනෝ
විපාකං පටිසේවති

යම් ක්‍රියාවක් කිරීමෙන් පසු තැවෙන්නට සිදු නොවේ ද, යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතු ව විඳිය හැකි වේ ද එබඳු ක්‍රියාවල නිරත විය යුතු ය.

??? ?????.m4a

# දිවි මගට එළිය දෙන දහම් පද

අත්තනාව කතං පාපං
අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං
අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං
නාඤ්ඤෝ අඤ්ඤං විසෝධයේ

යමෙකු පව් කළොත් එයින් ඔහු ම කෙලෙසෙන්නේ ය. යමෙකු පව් නොකළහොත් එයින් ඔහු ම පිරිසිදු වන්නේ ය. පිරිසිදුකම හෝ අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහිම ය. එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකි ය.

???????.m4a

# දිවි මගට එළිය දෙන දහම් පද



සුකරානි අසාධූනි
අත්තනෝ අහිතානි ච
යං වේ හිතං ච සාධුං ච
තං වේ පරම දුක්කරං

තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසු ය. යම් දෙයක් තමාට වැඩදායක ද යහපත පිණිස හෝ පවතී ද එවැනි දේ කිරීම ඉතා අපහසු ය.

???????.m4a

# දිවි මගට එළිය දෙන දහම් පද



අචරිත්වා බ්‍රහ්මචරියං
අලද්ධා යොබ්බනේ ධනං
ජින්නකොඤ්චාවඣායන්ති
ඛීන මච්ඡේව පල්ලලෙ

ඇතැම් අය තරුණ වයසේ දී උසස් පිළිවෙත්වල ද නොහැසිර ලබා ගත හැකි ධනය ද නොලැබ මහලු වූ පසු මසුන් නැති දිය හිඳුණු විලක් දෙස බලා දුක් වන කොස්වා ලිහිණියන් මෙන් තැවෙති.

???????? 1.m4a

# දිවි මගට එළිය දෙන දහම් පද

අචරිත්වා බ්‍රහ්මචරියං
අලද්ධා යොබ්බනේ ධනං
සෙන්ති චාපාතිඛීණාව
පුරාණානි අනුත්ථුනං



ඇතැම් අය තරුණ වයසේ ලබා ගත හැකි ධනය හෝ වෙනත් ප්‍රතිලාභයක් හෝ නොලැබ බඹසර නොහැසිර මහලු වූ පසු පෙර කරන ලද යම් යම් දේ සිහි කරමින් දුන්නෙන් මිදී ගොස් වැටුණු ඊතල මෙන් ශෝකයෙන් සුසුම් ලමින් සිටිති

???????? 2.m4a

# දිවි මගට එළිය දෙන දහම් පද



උට්ඨානවතෝ සතිමතෝ
සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්ස ච ධම්මජීවිනෝ
අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති

උත්සාහයෙන් ද, නිවැරැදි සිහියෙන් ද යුතු නිදොස් දේ විමසා බලා කරන තැන්පත් දැහැමි දිවි පැවතුම් ඇති නොපමා වූ පුද්ගලයාගේ කීර්තිය මනා ව වැඩේ

?????????.m4a

# දිවි මගට එළිය දෙන දහම් පද

1. ධම්ම පදය ත්‍රිපිටකයේ අඩංගු ධර්ම කරුණුවල සම්පිණ්ඩනයක් ලෙස සැලකිය හැකි ය.

2. ධම්ම පදය බෞද්ධයාගේ අත්පොත වශයෙන් සැලකේ.

3. එහි අඩංගු දහම් කරුණු කාල, දේශ සීමා, ජාති, ආගම් ආදි කිසිදු භේදයකින් තොර ව සියලු දෙනාට පරිහරණය කළ හැකි වටිනාකමකින් යුතු වේ.

# දිවි මගට එළිය දෙන දහම් පද

## පාඩමට අදාළ ධම්ම පද ගාථාවලින් පෙන්වා දෙන උපදේශ

- ආධ්‍යාත්මික වශයෙන් පිරිසිදුකම හෝ අපිරිසිදුකම හෝ පවතින්නේ තමා තුළම ය.
- අන් අයගෙන් තමාට සිදු වූ අවැඩ පිළිබඳ නැවත මෙනෙහි නොකරන්නාගේ වෛරය සංසිඳේ
- උත්සාහය, නිවැරැදි සිහිය, විමසා බලා කටයුතු කිරීම, තැන්පත් බව, දැහැමි දිවි පෙවෙත හා අප්‍රමාදී බව පුද්ගලයෙකුගේ දියුණුවට හේතු වන කරුණු ය.